ජනමාධ්‍ය ඔස්සේ නැවතත් සමාජගත වන "කුඩ්ඩා", "මත්ලෝලීන්" වැනි සෘණාත්මක හැඳින්වීම් වල ගැටළුව සම්බන්ධයෙන් අපි නැවත නැවතත් පෙන්වා දී ඇත්තෙමු. ජනසමාජයක භාවිතා වන වචන අනුව, එම ජනසමාජයේ චින්තනය හැඩගැස්වෙන බව පැවසේ. එසේ නම් මෙවන් සෘණාත්මක නාමකරණයන් ජනමාධ්‍ය තුළ නැවත නැවතත් සඳහන් වීම වැළැක්වීමෙන්, වඩාත් ශිෂ්ට සම්පන්න චින්තනයක් ජනසමාජය තුළ ඇතිවීම සඳහා දායකත්වයක් නොසැපයෙනු ඇතිද?

දෙවෙනුව, මෙවන් සෘණාත්මක හැඳින්වීම් ඔස්සේ එම කොටස් සමාජයෙන් වඩ වඩාත් කොන් වීමත් සිදුවේ. එය මෙම ගැටළුව විසඳීමට වඩා ඔඩු දිවීමට හේතුවක් නොවේ යැයි කිසිවෙකුට කිව නොහැකි වේ. කෙසේ නමුත් මෙවන් සෘණාත්මක හැඳින්වීම් කිරීමේ ප්‍රවණතාවයෙන් මිදෙමින් ඇතැම් පුවත්පත් වඩාත් සාධාරණ හා ශිෂ්ට යෙදුම් භාවිතා කරනු දැකීමද සතුටට හේතුවකි. අරුණ පුවත්පතේ "මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් මුදා ගැනීමේ සායන අද සිට" යන සිරස්තලය ඔස්සේ දැක්වෙන පුවත ඊට කදිම උදාහරණයකි.